ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நிலஅளவைத் திணைக்களம்.
**SURVEY DEPARTMENT OF SRI LANKA**

මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනය - දියතලාව
அளவையியல் படமாக்கல் நிறுவனம் – தியத்தலாவை
**Institute of Surveying and Mapping – Diyatalawa**

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකැටුල | :- "ඉන්සමැප්" | மின் தபால் | :- "இன்சமாப்" | Tele Mail | :- "INSURMAP" |
| දුරකථනය (පොදු) | :- +94 - 057-2229001 | தொலைபேசி (பொது) | :- +94 - 057-2229001 | Telephone (General) | :- +94 - 057-2229001 |
| දුරකථනය (අධ්‍යක්ෂ) | :- +94 - 057-2229002 | தொலைபேசி (பணிப்பாளர்) | :- +94 - 057-2229002 | Telephone (Director) | :- +94 - 057-2229002 |
| දුරලිපිය | :- +94 - 057-2229004 | தொலைநகல் | :- +94 - 057-2229004 | Fax | :- +94 - 057-2229004 |
| විද්‍යුත් තැපැල | :- snrdsgtr@survey.gov.lk | மின்னஞ்சல் | :- snrdsgtr@survey.gov.lk | E-Mail | :- snrdsgtr@survey.gov.lk |


මගේ අංකය - අයි/පුහුණු/01/බඳවාගැනීම/2022
2022.01.13

දිශානුගත කිරීමේ පාඨමාලාව(OC)/මැනුම් විද්‍යා පාඨමාලාව (BDC)/වාරි සෞභාගයා පාඨමාලාව යන පාඨමාලා සඳහා තේරී පත්වූ සියලුම පුහුණුලාභීන් වෙත,

**<u>පුහුණුව සඳහා දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත වාර්ථා කිරීම.</u>**

**<u>( දිශානුගත කිරීමේ පාඨමාලාව, මැනුම් විද්‍යා පාඨමාලාව සහ වාරි සෞභාගයා පාඨමාලාව).</u>**

උක්ත පාඨමාලා හැදෑරීම සඳහා තේරීපත්වී ඇති ඔබ පහත සඳහන් උපදෙස් අනුව දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත වාර්ථා කළ යුතු බව කාරුණිකව දන්මි.

1. සියලුම පුහුණුලාභීන් 2022.02.01 දින පෙ.ව. 7.00ට මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පුහුණුව සඳහා වාර්ථා කළ හැකි වන පරිදි, 2022.01.31 දින පෙ.ව.8.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුල දියතලාව, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වෙත වාර්තා කළ යුතු බව දන්වා සිටිමි. තවද ආයතනයේ පිවිසුමෙහි දී අදාළ උපදෙස් ඔබ වෙත ලබා දෙනු ඇත.

2. ඔබගේ නේවාසික පුහුණුව සඳහා ඔබහට තනිකඩ නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.තම කාලත්‍රයාද උක්ත පාඨමාලා සඳහා තේරී පත්ව ඇත්නම් පමණක් එම දෙපළට එක් නිළනිවාසයක් ලබා දෙනු ලැබේ.

3. තවද, වෙනත් විශේෂ හේතුවක් තිබේ නම් ඒ පිළිබඳව හේතු සහිතව අධ්‍යක්ෂ(මැ.සි.ආ) වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතුය.එම ඉල්ලීම 2022.01.21 දින හෝ ඊට පෙර ෆැක්ස් අංක 0572229004ට යොමු කරන්න.මෙම අවස්ථාවේ පාඨමාලා තුනක සිසුන් ආයතනය තුළ නේවාසික පුහුණුව ලැබීමට නියමිත බැවින් සහ පවතින නවාතැන් පහසුකම් ඉතා සීමිත බැවින් එවැනි ඉල්ලීම් සඳහා අවස්ථාව ලබා දෙනු ලබන්නේ පවත්නා ඉඩ පහසුකම් මත පමණක් බව කාරුණිකව දන්වා සිටිමි.

4. උක්ත පාඨමාලා සඳහා සහභාගිවන සියළුම පුහුණුලාභීන් 2022.01.28 සහ 2022.01.31 අතර කාල සීමාව ඇතුලත කොවිඩ්-19 සඳහා ක්ෂණික ප්‍රතිදේහ ජනන පරීක්ෂණයක් (Rapid Antigen Test) කරවාගෙන එම රෝගයෙන් නොපෙලෙන බවට අදාළ සහතිකය මෙම ආයතනයට පැමිණෙන දින ඉදිරිපත් කිරීම අනිවාර්යයා වේ.

5. COVID-19 ප්‍රතිශක්තිකරණ එන්නත ලබාගත් බව සනාථ කරන කාඩ්පතද අනිවාර්යයෙන් රැගෙන ආ යුතුය.

6. 2022.01.31 දිනට ආසන්න දින 14ක් තුළ ඔබ හෝ ඔබ පවුලේ සාමාජිකයෙකුහට COVID-19 වෛරසය ආසාදනය වුවහොත් හෝ නිවෙස් නිරෝධායනට ලක් වුවහොත් හෝ ඒ බව අප වෙත වාර්ථා කළ යුතුය.

7. මෙම පුහුණු පාඨමාලාව දැනට රජයේ සෞඛ්‍ය අංශ විසින් පවත්වාගෙන යන මාර්ගෝපදේශ වලට අනුව සංවිධානය කරනු ලබන බැවින් මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය තුළ සෑම විටම පුද්ගල දුරස්ථභාවය පවත්වා ගත යුතු අතර සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුගතව කටයුතු කළ යුතුවේ. තවද මෙම පුහුණු කාලය තුල මුව ආවරණ (Face Masks), මුහුණු ආවරණ (Face Shields), අත් විෂබීජහාරක (hand sanitisers) භාවිතා කළයුතු අතර ඔබගේ පෞද්ගලික පරිහරණයට අවශ්‍ය ප්‍රමාණය රැගෙන ආ යුතුය.

8. රාජකාරි වේලාවෙන් පසුව පරිශ්‍රය තුළ සාමූහිකව හැසිරීම නොකළ යුතුය.

9. අසනීප තත්වයක් ඇති වූ විට වහාම ආචාර්ය මණ්ඩලය දැනුවත් කළ යුතු අතර ප්‍රතිකාර සඳහා ඉක්මනින් යොමු විය යුතුය

කේ.කේ. සුනිල් රත්නායක
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු)

කේ. කේ සුනිල් රත්නායක
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු)
අධ්‍යක්ෂ
මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය
දියතලාව.